# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

සමාජීය විද්‍යා පීඨය

## ආර්ථිකවිද්‍යාව

## ආර්ථිකවිද්‍යා මූලධර්ම - ECON 18214

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. (අ) ආර්ථිකවිද්‍යා විෂයෙහි විවිධ සංවර්ධන අවධීන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ආ) ආවස්ථික පිරිවැය සහ නිෂ්පාදන හැකියා මායිම අතර පවත්නා සම්බන්ධතාව කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ඉ) 'නිදහස් වෙළඳපොල ක්‍රමය' යන්නෙන් අදහස් කරනුයේ කුමක්ද? (ලකුණු 04)

(ඊ) 'ආර්ථික බදු කුලිය' යනුවෙන් කුමක් අදහස් කරන්නේද? (ලකුණු 04)

02. පහත සඳහන් දෑ සඳහා පිළිතුරු සැපයීමේ දී රූප සටහන් භාවිතා කරන්න.

(අ) පහත ඒවා වෙළඳපොලට හඳුන්වාදීම මගින් සිදුවිය හැකි බලපෑම් මොනවාද?

I. ආනයන තීරු බද්දක් පැනවීම
II. අපනයන තීරු බද්දක් පැනවීම
III. නිෂ්පාදන මත බද්දක් පැනවීම

(එක් කොටසකට ලකුණු 04 බැගින්)

ආ) පහත දැක්වෙන පද මගින් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

I. සුබසාධන හානිය (deadweight loss)
II. නිෂ්පාදන පිහිටාධාරය

(එක් කොටසකට ලකුණු 04 බැගින්)

03. (අ) භාණ්ඩයක් සඳහා ඉල්ලුම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර වෙනස කුමක් ද? රූපසටහනක් ආශ්‍රයෙන් එකී වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

(ආ) ආදායම් ඉල්ලුම් නම්‍යතා සංකල්පය භාවිතයෙන් සාමාන්‍ය භාණ්ඩ, බාල භාණ්ඩ සහ සුබෝපභෝගී භාණ්ඩ නිර්වචනය කරන්න. (ලකුණු 06)

(ඉ) කල්පිත නගරයක 'X' නම් භාණ්ඩය සඳහා වෙළෙඳපොල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත ආකාර වේ.

$$Q_d = 110 - P \qquad Q_s = -40 + 2P$$

I. මෙම වෙළඳපොලෙහි සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 04)

II. සමතුලිතයේ දී සමස්ත අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 03)

III. මිල රුපියල් 60 දී ඉල්ලුමෙහි මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 03)

04. (අ) නිෂ්පාදන ශ්‍රිතයක් යනු කුමක්ද?

(ආ) ආර්ථික පිරිමැසුම් හා ආර්ථික නොපිරිමැසුම් හට ගැනීමට හේතු මොනවාද?

(ඉ) අයභාර වක්‍ර සහ පිරිවැය වක්‍ර අතර පවත්නා සම්බන්ධතාව කුමක්ද?

(ඊ) කෙටි කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍ර හා ආන්තික පිරිවැය වක්‍ර යොදාගනිමින් දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය හා ආන්තික පිරිවැය වක්‍රය ව්‍යුත්පන්න කරන්නේ කෙසේ ද? උචිත රූපසටහන් භාවිත කරමින් පිළිතුර පැහැදිලි කරන්න.
(එක් කොටසකට ලකුණු 05 බැගින්)

05. (අ) පූර්ණ තරඟකාරී ආයතනයක් මුහුණ දෙනුයේ කවර ස්වරූපයේ ඉල්ලුම් වක්‍රයකට ද? හේතු පැහැදිලි කරන්න.

(ආ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක සහ ඒකාධිකාරී වෙළඳපොලක කෙටිකාලීන සමතුලිතය අතර පවත්නා වෙනස්කම් මොනවා දැයි සන්සන්දනය කරන්න.

(ඉ) කිසියම් කර්මාන්තයක වෙළඳපොල ව්‍යුහය නිර්ණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක කවරේ ද?

(ඊ) හීනවන ආන්තික ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල ආයතනයක නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
(එක් කොටසකට ලකුණු 05 බැගින්)

06. පහත යුගල අතර වෙනස පහදන්න.

(අ) පාලන මිල හා කළු කඩ මිල
(ආ) යථානුරූපී ආර්ථිකවිද්‍යාව හා අභිමතානුරූපී ආර්ථිකවිද්‍යාව
(ඉ) මිල නායකත්වය හා මිලදැඩියාව
(ඊ) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර

(ලකුණු 05 බැගින්)

07. (අ) 'ආර්ථික අවබෝධය හා විශ්ලේෂණය සඳහා ජාතික ගිණුම් දත්ත ඉතා ප්‍රබල උපකරණයක් වේ.' පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ආ) පහත සඳහන් එක් එක් දෑ නිර්වචනය කරන්න.

I. දළ ජාතික නිෂ්පාදිතය
II. වැය කළහැකි ආදායම
III. නිෂ්පාදන ඉම (මායිම)
IV. ස්වායත්ත පරිභෝජනය (ලකුණු 03 බැගින්)

08. (අ) විනිමය සමීකරණය යනු කුමක් දැයි? නිර්වචනය කර එහි එක් එක් විචල්‍ය හඳුන්වන්න. (ලකුණු 06)

(ආ) විනිමය මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීමට මුදල් විසින් සපුරාලිය යුතු නිර්ණායක කවරේද? (ලකුණු 06)

(ඉ) පහත දැක්වෙන විනිමය අනුපාතික ක්‍රම යටතේ මහ බැංකුවේ කාර්යභාරය කුමක්ද?

I. ස්ථාවර අනුපාතික ක්‍රමය
II. පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය (ලකුණු 04 බැගින්)

09. පහත දැක්වෙන හතරක් (04) පිළිබඳ සටහන් ලියන්න.

I. ආර්ථික කාර්යක්ෂමතාව
II. මිල අපේක්ෂතා නම්‍යතාව
III. විචල්‍ය සාධක අනුපාත නියාමය
IV. ද්‍රවශීලතාව
V. ස්වාර්ථය (ලකුණු 05 බැගින්)

**********************************